


## මෙම සමාගමේ පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## රිගර් III වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** උසස් නිළධාරින්ගේ මග පෙන්වීම යටතේ අංශයේ විෂය පථය යටතේ ඇති සියළුම ඇන්ටෙනා ස්ථාපනය කිරීම, ඇන්ටෙනා නඩත්තු කිරීම, ඇන්ටෙනා ව්‍යුහයන් , ඇන්ටෙනා කේබල් කිරීම වැනි කර්යයන් ඉටු කිරීම.

**රැකියාවේ වගකීම් :**

I ඇන්ටෙනා (HF, VHF , UHF , ADS-B, මයික්‍රොවේව්) ස්ථාපනය සහ පෙළගැස්ම

11 ඇනටෙනා කුළුණු වල දෝෂ නිවැරදි කිරීම සඳහා සහභාගී වීම

111 ඇන්ටෙනා කේබල් ස්ථාපනය සහ ප්‍රතිසථාපනය

1V බාධක ලාම්පු අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම

V අකුණු සන්නායක ස්ථාපනය කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම

VI ඇන්ටෙනා කුළුණු අළුත්වැඩියා කිරීම , පින්තාරු කිරීම සහ කේබල් කිරීම පිළිබඳ දැනුමක් ඇතිව වෙනත් වැඩට අදාළ රාජකාරිවලට සහභාගී වීම.

VII අංශ ප්‍රධානී හෝ වෙනත් බලයලත් නිළධාරීන් පවරනු ලබන අනෙකුත් රාජකාරීන් ඉටු කිරීම.

01. **සුදුසුකම් :**

i අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් ගණිතය, සිංහල සහ ඉංග්‍රිසි යන විෂයයන් ඇතුළුව විෂයයන් 6කින් සමත්ව සිටිය යුතුයි.

ii පිළිගත් ආයතනයක වසර හයක (06) සේවා පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

iii යාන්ත්‍රික කටයුතු පිළිබඳ දැනුමක් හා මෙවලම් හඳුනා ගැනීම සහ භාවිතා කිරීම පිළිබඳ ප්‍රායෝගික දැනුමක් තිබීම.

iv මීටර් 100 නොවැඩි ඇනටෙනා කුළුණු නැගීමට හා කුළුණු මත සිට ඇන්ටෙනා අළුත් වැඩියා කිරීම හා ස්ථාපනය කිරීමේ හැකියාව තිබිම.

v ඇන්ටෙනා කුළුනු අළුත් වැඩියා කිරීම සහ කේබල් ඇදීම පිළිබඳ රිගර් වරයෙකු ලෙස සේවා පළපුරුද්දක් ඇති අයවළුන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

02. **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

03. **වැටුප :** තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

04. **තෝරා ගැනීමේ ක්‍රමය :** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම ස්ථානයක සේවය කල යුතු වේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතයක් පහත සඳහන් ලිපිනයට 2026 **මැයි මස 18 වන දිනට** පෙර ලැබෙන සේ **ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුවේ.

**සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික වල ඡායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අනුමත මාධ්‍ය වලින් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

**සභාපති**
**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

Adv. 03/05/2026